**ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2011**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

2011 දෙසැම්බර් 31 දිනට ලක්ෂ්මන් කදිරගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 ගිණුම් ප්‍රතිපත්ති

ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ ස්ථාවර තැන්පතු පොලී හා ශ්‍රවනාගාර කුලී ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණු අතර, වර්ෂයේ වියදම් උපචිත පදනම මත ගිණුම්ගත කර තිබුණි. මෙහිදී එකම ආයතනයක ගිණුම් ප්‍රතිපත්ති දෙකක් අනුගමනය කරන බව විගණනයේදී නිරීක්ෂණය විය.

1..3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (සංශෝධන) පනත<br>10 ඉ (I), (2) (I) හා (II) වගන්ති | පනත ක්‍රියාත්මක කිරීමේ දිනයේ සිට බල පැවැත්වෙන පරිදි බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය (බීඅයිඩීටීඅයි) මෙම ආයතනය වෙත පවරනු ලැබිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළදී ද පනත ප්‍රකාර එකී පුහුණු ආයතනය විසින් පවත්වා ගෙන යනු ලැබූ ගිණුම්වල ඇති මුදල් මෙම ආයතනයේ අරමුදලට බැර කිරීමක් හෝ එම පුහුණු ආයතනයේ සේවයේ නියුක්ත නිලධාරීන් සහ සේවකයන් මෙම ආයතනයේ සේවකයන් ලෙස අනුයුක්ත කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. තවද පනත ප්‍රකාරව ආයතනයේ වත්කම් බැරකම් පවරා ගැනීමක් හෝ සිදුකර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | මාසික වැටුප රු.75,000 ක් වූ නිලධාරියෙකුගේ වැටුපෙන් උපයන විට ගෙවීම් බදු අඩුකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | |
| (i) 9.2 ඡේදය | සංවිධාන සටහන සමඟ ඒකාබද්ධ කරන ලද අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලේඛනගත කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 9.3.1 ඡේදය | මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියට යටත්ව අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද එකිනෙක තනතුරු සඳහා වූ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදයක් ආයතනය සකස් කර නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය සමාලෝචනය

### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

2011 වර්ෂයේ ආයතනයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.563,642 ක ඌණතාවයක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ රු.2,308,847 ක අතිරික්තයක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,872,489 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේ ආදායම රුපියල් මිලියන 2.3 කින් අඩුවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

පනත අනුව විශේෂයෙන් රාජ්‍ය ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, නීතිය, ආර්ථික විද්‍යාව, සංස්කෘතික සම්බන්ධතා, කෘෂිකර්මය හා පාරිසරික හා උපාය මාර්ග අධ්‍යයනයන්, ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ ප්‍රවර්ධනය කිරීමත් ඊට අමතරව සාමය ප්‍රවර්ධනය කිරීම හා පශ්චාත් ගැටුම් පිළිබඳ ප්‍රශ්න විසඳීමෙහි නියැළී සිටින සහ එම ක්ෂේත්‍රවල පර්යේෂණවලට ආධාර කිරීම සහ එම තැනැත්තන් පුහුණු කිරීම ආදී බහුවිධ පුහුණු පර්යේෂණ ආයතනයක් වශයෙන් කටයුතු කිරීම ආයතනයේ අරමුණ වුවත් සමාලෝචිත වර්ෂය තුළදී එවැනි ක්ෂේත්‍රවලට අදාල කටයුතුවල නිරත වූ බවට තහවුරු නොවිණි.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.573,199 වටිනා භාණ්ඩ සම්බන්ධව මිල කැඳවීම් සිදුකර නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය
---------------------------

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6:5:1 වගන්තිය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 පෙබරවාරි 11 දින විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබුණි.

4.2 සංයුක්ත සැලැස්ම
-----------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.1 ඡේදය ප්‍රකාර ආයතනය පිහිටුවීමේ අරමුණ සපුරාගනු වස් වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා වූ සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

4.3 ක්‍රියාකාරී සැලැස්ම
------------------------

වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4.4 අයවැය ලේඛනමය පාලනය
--------------------------------

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදයේ සඳහන් පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ආයතනවල ඉලක්ක මුදුන් පමුණුවා ගැනීම සඳහා වූ අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

4.5 වාර්ෂික වාර්තා ප්‍රසිද්ධ කිරීම
--------------------------------

2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්
--------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා විධායක අධ්‍යක්ෂවරයා වෙත වරින්වර මාගේ වාර්තා මඟින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) සේවක මණ්ඩලය

(ආ) අයවැය පාලනය

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම